# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2268/97 – 2022 පෙබරවාරි 26 වැනි සෙනසුරාදා – 2022.02.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 64ඒ, උතුරු කටාන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හරක්ගාලේගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/KAT/2019/190 හා 2019.07.04 දිනැති පුගමන අනුරේඛනයේ දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – මිල්ලගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0813 ක් පමණ**

උතුරට: එම්. ජී. එම්. ඒ. ටී. ප්‍රනාන්දු සහ ජී. එම්. රුදිගු හිමිකම් කියන මිල්ලගහවත්ත; නැගෙනහිරට: ජයලත් මාතා මාවත; දකුණට: කැබලි අක්ෂර B; බටහිරට: යූ. එල්. එස්. එස්. පෙරේරා හිමිකම් කියන මිල්ලගහවත්ත.

02. **කැබලි අක්ෂර 'B' – මිල්ලගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0452 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර A; නැගෙනහිරට: ජයලත් මාතා මාවත; දකුණට: එම්. ජී. එම්. ඒ. ටී. ප්‍රනාන්දු හිමිකම් කියන මිල්ලගහවත්ත; බටහිරට: යූ. එල්. එස්. එස්. පෙරේරා හිමිකම් කියන මිල්ලගහවත්ත.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2018/WS/181.
2021 ඔක්තෝබර් මස 07 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 02 – 0678

1A – G 36220 – 20 (2022/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*